" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

ISO 9001 · SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/30-38/FI/01(2025) | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2025.06.19 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය (බ.ප)

ලේකම්, පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)

සභා ලේකම්, බස්නාහිර පළාතේ පළාත් සභා ලේකම් කාර්යාලය (බ.ප.)

ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය (බ.ප.)

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු)

පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)

ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.)

අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)

ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්

<u>**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.**</u>

උක්ත කරුණට අදාලව ඇමුණුම 01 හි සඳහන් චක්‍රලේඛ / චක්‍රලේඛ ලිපි බස්නාහිර පළාතට අදාල කර ගැනිම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19-2025 හා 2025.06.16 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

02. මෙම චක්‍රලේඛ / චක්‍රලේඛ ලිපි පිටපත් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛ / චක්‍රලේඛ ලිපි වල සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

නදීෂා ඕ. සපරමාදු,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

දුරකථන අංකය : 011-2092608
ෆැක්ස් අංකය : 011-2092605
විද්‍යුත් ලිපිනය : cswpadm@gmail.com

බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය
மேல் மாகாண ஆளுநர் பணிமனை
GOVERNOR'S OFFICE - WESTERN PROVINCE

අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
இல. 204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
No. 204, Denzil Kobbekaduwe Mawatha Battaramulla.

ඔබේ අංකය. / உமது இல. / Your Ref. CSWP/ADM/30-38/FI/01
මගේ අංකය / எனது இல. / My Ref. GOS/ADM/6/2/19-2025
දිනය / திகதி / Date 2025.06.16

"ජනතා හිතවාදී විශිෂ්ඨතම පළාත් රාජ්‍ය සේවාවක්" - "பொது மக்களுக்கு சிறந்த பொதுச் சேவை" - "People Friendly Excellent Public Service"

18 JUN 2025

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාත.

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ ( මුදල් චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කම්ටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.**

උක්ත මැයෙන් යුතුව මා අමතන ලද ඔබේ සමාංක හා 2025.05.30 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව පහත ඇමුණුම 01 හි සඳහන් චක්‍රලේඛයන් යෝජිත විධිවිධාන සහිතව බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

කේ.කේ.ජී.අයි.ඩී.පී. විජේතිලක
ආණ්ඩුකාර ලේකම්
බස්නාහිර පළාත

දුරකතන අංක - 0112-092816
ෆැක්ස් - 0112-092813
විද්‍යුත් තැපැල - governoroffice@secgov.wp.gov.lk

| චක්‍රලේඛ අංකය | චක්‍රලේඛ නිකුත් කළ දිනය | කාරණය | |
|---|---|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ 14//2025 | 2025.04.11 | පාසල් ළමුන් සඳහා ආහාර ලබා දීමේ රජයේ පෝෂණ වැඩසටහන | විධිවිධාන පවතින ආකාරයෙන්ම බස්නාහිර පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා |
| ආපදා සහන සේවා මාර්ගෝපදේශ අංක 01/2025(i) | 2025.05.16 | හදිසි ආපදා තත්ත්වයකදී විපතට පත්වන ජනතාවට හා ආපදා අවදානම් හේතුවෙන් පදිංචි වාසස්ථාන වලින් ඉවත් කරන ජනතාවට සහන සැලසීම, හානියට පත්වන දේපළ යථා තත්ත්වයට පත් කිරීම සහ වන්දි ගෙවීම සම්බන්ධ මාර්ගෝපදේශය | |
| පොදු චක්‍රලේඛ ලිපි 02-60/2025 | 2025.04.25 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 විධිවිධාන පරිදි අතිකාල දීමනා / අමතර රාජකාරී දීමනා අනුමත කිරීම | |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020(ii) | 2025.05.26 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | |
| පොදු චක්‍රලේඛ ලිපි 02-2024 | 2024.10.11 | ආයුර්වේද වෛද්‍ය ආයතනවල රෝගීන්ට සහ කනිෂ්ඨ සේවකයින්ට ආහාර සැපයීම | විධිවිධාන පවතින වාර්ෂික ප්‍රතිපාදන සීමාව තුළ කළමණාකරණය කර ගැනීමට යටත්ව පවතින ආකාරයෙන්ම බස්නාහිර පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා |
| අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන ලේකම් ගේ අංක ED/4/58/25/3/PE/440 | 2025.04.25 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015(V) විධායක සේවා ගණයේ නිලධාරීන්ට රු.25,000.00ක විශේෂ දීමනාව ගෙවීම සහ අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 16/2017 ප්‍රකාරව විදුහල්පතිවරුන් සඳහා රු. 6,500.00 ක විශේෂ දීමනාව ගෙවීම | රාජ්‍ය පරිපාලන සහ පළාත් සභා පළාත් පාලන ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ EST-7/03/ALW/2004-ii (තාව) හා 2025.02.06 දිනැති ලිපියේ සඳහන් උපදෙස් පවතින ආකාරයෙන්ම බස්නාහිර පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා |
| පොදු චක්‍රලේඛ ලිපි 01-52/2017 | 2017.10.05 | ඖෂධවේදී නිලධාරීන් සඳහා රාජකාරි වේලාවෙන් පරිබාහිරව පෞද්ගලිකසේවයේ යෙදීමට අවසර ලබා දීම | • කොදේසි අංක 02 යටතේ "පෞද්ගලික සේවයේ යෙදෙන නිලධාරීන් අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ඒ සඳහා පූර්ව අනුමැතිය ලබා ගත යුතුයි" යන වගන්තියට "පළාත් පාලන විෂය භාර අදාල පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයා" ලෙස සංශෝධනය සහ අනෙකුත් විධිවිධාන පවතින ආකාරයෙන්ම බස්නාහිර පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා |

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 18/2020 (II)

මගේ අංකය : EST/2/05/POL/0087
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2025.05.26

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ 2022.10.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 (I) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ නිලධරයන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි 2.1 ඡේදයේ සඳහන් භාෂා පාඨමාලා හැදෑරීම මඟින් හෝ අ.පො.ස (සා/පෙළ) දෙවන බස සිංහල/දෙමළ විෂයය සමත් වීම සමඟ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි 2.1 ඡේදයේ සඳහන් කාණ්ඩවලට අනුරූපී මට්ටම් අනුව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකට පෙනී සිට ඉන් සමත් වීම මඟින් හෝ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට හැකියාව ලැබෙන පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සංශෝධනය කිරීමට සහ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කර ගත යුතු සියලුම නිලධරයන් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 (I) මඟින් 2024.10.16 දින දක්වා ලබා දී තිබූ සහන කාලය 2026.10.16 දින දක්වා දීර්ඝ කිරීමට 2025.04.21 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

03. ඒ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි 2.4 ඡේදයට පසුව 2.5 ලෙස නව ඡේදයක් ඇතුළත් කෙරේ.

"2.5 ඉහත පාඨමාලා වෙනුවට අ.පො.ස (සා/පෙළ) දෙවන බස සිංහල/දෙමළ විෂයය සමත් වීම සමඟ ඉහත 2.1 ඡේදයේ සඳහන් කාණ්ඩවලට අනුරූපී මට්ටම් අනුව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකට පෙනී සිට ඉන් සමත් වීම මඟින් ද නිලධරයන්ට අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා අවශ්‍යතාවෙන් නිදහස් වීමට අවස්ථාව හිමි වේ."

04. නව සුදුසුකම පිළිබඳවත් සංශෝධිත සහන කාලය පිළිබඳවත් අදාළ නිලධරයන් දැනුම්වත් කරන මෙන් ද මෙයින් දන්වා සිටිමි.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011-2693886
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් ලිපිනය : ade-ii@pubad.gov.lk